# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2013 අංක 12 දරන මුදල් පනත

---

**[සහතිකය සටහන් කළේ 2013 අප්‍රේල් මස 23 වැනි දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2013 අප්‍රේල් මස 26 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ :** රු. 10.00 යි. **තැපැල් ගාස්තුව :** රු. 10.00 යි.

# 2013 අංක 12 දරන මුදල් පනත

[සහතිකය සටහන් කළේ 2013 අප්‍රේල් මස 23 වැනි දින]

එල්. ඩී.—ඕ. 5/2013.

**1995 අංක 16 දරන මුදල් පනත, 2003 අංක 25 දරන මුදල් පනත සහ 2012 අංක 12 දරන මුදල් පනත සංශෝධනය කිරීම පිණිස ද; බෝග රක්ෂණ බද්දක් පැනවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද; ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2013 අංක 12 දරන මුදල් පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

## I වන කොටස

## 1995 අංක 16 දරන මුදල් පනතේ II වන කොටස සංශෝධනය කිරීම

2. (මේ කොටසේ මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1995 අංක 16 දරන මුදල් පනතේ 5 වන වගන්තිය, ඒ වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:— 1995 අංක 16 දරන පනතේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(1අ) මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, (203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනත යටතේ ද්විත්ව කාර්යය වාහනයක් වශයෙන් ලියාපදිංචි කරනු ලැබූ සැහැල්ලු ට්‍රක් රථයක් සම්බන්ධයෙන් එම අර්ධ සුඛෝපභෝගී ද්විත්ව කාර්ය මෝටර් වාහන බද්ද 2013 ජනවාරි මස 1 වන දින සිට බලපවත්වන පරිදි, අයකරනු නොලැබිය යුතු ය.".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ "ඩීසල් මෝටර් වාහනය" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන් :—

" "ද්විත්ව කාර්ය වාහනය" යන්නට (203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනතේ එම යෙදුමට දී ඇති අර්ථය ම තිබිය යුතු ය ;";

(2) "සුඛෝපභෝගී මෝටර් වාහනය" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන් :—

" "සැහැල්ලු ට්‍රක් රථය" යන්නෙන් භාණ්ඩ ගෙන යාමේ කාර්යය සඳහා සම්පූර්ණයෙන් හෝ ප්‍රධාන ලෙස නිර්මාණය කරනු ලැබූ හෝ සාදනු ලැබුවා වූ ද, රියදුරු සහ මගියා සඳහා එකම හරස් රේඛාවේ තනි පෙළට අසුන් ගැනීමේ පහසුකම් සහිත රියදුරු කුටියක් සහිත ද්විත්ව කාර්ය වාහනයක් අදහස් වේ ;";

(3) "අර්ධ සුඛෝපභෝගී ද්විත්ව කාර්ය මෝටර් වාහනය" යන යෙදුමේ අර්ථ නිරූපණය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපණය ආදේශ කිරීමෙන් :—

" "අර්ධ සුඛෝපභෝගී ද්විත්ව කාර්ය මෝටර් වාහනය" යන්නෙන් ද්විත්ව කාර්ය වාහනයක් ලෙස (203 වන අධිකාරය වූ ) මෝටර් වාහන පනත යටතේ ලියාපදිංචි කර ඇති සුඛෝපභෝගී හෝ අර්ධ සුඛෝපභෝගී මෝටර් වාහනයක් අදහස් වේ ;".

වලංගු කිරීම.

**4.** 2013 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වී, මෙම පනත සම්බන්ධයෙන් කථානායකවරයාගේ සහතිකය ඔහුගේ අත්සන ඇතිව සටහන් කරනු ලැබූ දිනයෙන් අවසන් වන කාලසීමාව තුළ දී, ප්‍රධාන ප්‍රඥප්තියේ විධිවිධාන සලස්වා ඇති ආකාරයට සැහැල්ලු ට්‍රක් රථයක් සම්බන්ධයෙන් අර්ධ සුඛෝපභෝගී ද්විත්ව කාර්ය මෝටර් වාහන බද්ද අය කරනු ලැබූ හෝ එකතු කරනු ලැබූ යම් තැනැත්තකු හෝ පුද්ගල මණ්ඩලයක්, නිසි බලය ඇතිව ක්‍රියා කර ඇති ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ බදු එකතු කර ගැනීම වලංගු ආකාරයෙන් කරනු ලැබ ඇති හා කරන ලද ලෙස සලකනු ලැබිය යුතු ය:

එසේ වුව ද, ඉහතින් වූ විධිවිධාන, එම කාලසීමාව තුළ අයකරන ලද හෝ එකතු කරන ලද එම බද්ද සම්බන්ධයෙන් අධිකරණයකින් දෙන ලද තීරණයකට හෝ ආඥාවකට හෝ අධිකරණයක අවසන් නොවී පවතින නීති කෘත්‍යයකට බලපානු නොලැබිය යුතු ය.

II වන කොටස

## 2003 අංක 25 දරන මුදල් පනතේ II වන කොටස සංශෝධනය කිරීම

**5.** 2003 අංක 25 දරන මුදල් පනතේ II වන කොටස (සංචාරක සංවර්ධන බද්ද), ඒ කොටසේ 11 වන වගන්තියේ "කොමිස් මුදලින් එම බදු ද අයකරනු නොලැබිය යුතු ය." යන වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

2003 අංක 25 දරන පනතේ II වන කොටසේ 11 වන වගන්තිය සංශෝධනය කිරීම.

"කොමිස් මුදලින් එම බද්ද අය කරනු නොලැබිය යුතු ය:

එසේම තව දුරටත්, එම බද්ද රුපියල් මිලියන දොළහක් නොඉක්මවන වාර්ෂික පිරිවැටුමක් හෝ කාර්තුවකට රුපියල් මිලියන තුනක් නොඉක්මවන පිරිවැටුමක් සහිත යම් ආයතනයකින් අය කරනු නොලැබිය යුතු ය.".

III වන කොටස

## 2012 අංක 12 දරන මුදල් පනතේ IV වන කොටස සංශෝධනය කිරීම

**6.** (මේ කොටසේ මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන ) 2012 අංක 12 දරන මුදල් පනතේ IV වන කොටසේ ශීර්ෂය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ශීර්ෂය ආදේශ කරනු ලැබේ:-

2012 අංක 12 දරන පනතේ IV වන කොටසේ ශීර්ෂය සංශෝධනය කිරීම.

**"ඇතැම් පනත්වල විධිවිධාන අදාළවීමෙන් ඇතැම් ව්‍යවසායන් නිදහස් කිරීම".**

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය, ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(අ) මේ පනත යටතේ නියෝග මගින් ප්‍රකාශයට පත් කරන ලද නිදහස් වරායක දී හෝ බන්ධිත ප්‍රදේශයක දී එම කටයුතුවල නිරතවිය හැකි ය ; ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය සංශෝධනය කිරීම.

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය, ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(අ) මේ පනත යටතේ නියෝග මගින් ප්‍රකාශයට පත් කරන ලද නිදහස් වරායක දී හෝ බන්ධිත ප්‍රදේශයක දී එම කටයුතුවල නිරත විය හැකි ය ; ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය සංශෝධනය කිරීම.

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය, ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(අ) මේ පනත යටතේ නියෝග මගින් ප්‍රකාශයට පත් කරන ලද නිදහස් වරායක දී හෝ බන්ධිත ප්‍රදේශයක දී එම කටයුතුවල නිරත විය හැකි ය ; ".

ප්‍රධාන ප්‍රඥප්තියට 18අ,18ආ සහ 18ඇ වගන්ති ඇතුළත් කිරීම.

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ 18අ, 18ආ සහ 18ඇ වගන්ති වශයෙන් බලපැවැත්විය යුතු ය :-

"ඇතැම් පනත් අදාළ වීමෙන් ඇතැම් ව්‍යාවසායන් නිදහස් කිරීම.

18අ. (1) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ඇතිකර ගත් ගිවිසුමක අර්ථානුකූලව පහත දැක්වෙන යම් ව්‍යාපාරයක් හෝ ව්‍යාපාරවල නිරතවන යම් ව්‍යවසායක්, (2) වන සහ (3) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති පනත්වල විධිවිධාන අදාළ වීමෙන් නිදහස් වන්නේ යː-

(අ) ආනයනය, සුළු පිරිසැකසුම් සහ ප්‍රතිඅපනයනය සම්බන්ධ අන්තරාල වෙළෙඳාම;

(ආ) එක් රටකින් සපයනු ලැබිය හැකි හෝ එක් රටක දී නිෂ්පාදනය කරන ලද හෝ භාණ්ඩ ශ්‍රී ලංකාවට ගෙන එනු ලැබීමෙන් තොරව වෙනත් රටකට නැව්ගත කළ හැකි අක්වෙරළ ව්‍යාපාර;

(ඇ) විදේශීය සේවාදායකයන්ට පෙර නිමි සේවා සැපයීම ;

(ඈ) මූල්‍ය සැපයුම් දාමය කළමනාකරණය කිරීම සහ බිල්ගත කිරීම් මෙහෙයවීම මගින් ප්‍රධාන පෙළේ ගැනුම්කරුවන්ගේ මූලස්ථාන මෙහෙයුම් කටයුතු සිදු කිරීම ;

(ඉ) ශ්‍රී ලංකාව තුළ බන්ධිත ගුදම් හෝ විවිධ රටවල් සංගෘහිත කිරීම වැනි සැපයුම් සේවා සිදු කිරීම.

(2) ප්‍රතිඅපනයනය කිරීම සඳහා භාණ්ඩ, ගුදම් භාණ්ඩ හෝ වෙළෙඳ භාණ්ඩ ආනයනය කිරීමෙහි නිරතව සිටින (1) වන උපවගන්තියේ සඳහන් යම් ව්‍යවසායක්-

(අ) මේ පනතේ නියෝග මගින් ප්‍රකාශයට පත් කරන ලද නිදහස් වරායක දී හෝ බන්ධිත ප්‍රදේශයක දී එම කටයුතුවල නිරතවිය හැකි ය ;

(ආ) එවැනි නිදහස් වරායක සිට හෝ එවැන්නක් දක්වා හෝ බන්ධිත ප්‍රදේශයක සිට හෝ එවැන්නක් දක්වා ශ්‍රී ලංකා භූමියෙන් හෝ ශ්‍රී ලංකා භූමියට භාණ්ඩ සංචලනය කිරීමේ දී, (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, එම භාණ්ඩ, අවස්ථාවෝචිත පරිදි, ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද හෝ ශ්‍රී ලංකාවෙන් අපනයනය කරන ලද භාණ්ඩ ලෙස සලකා රේගු ආඥාපනතේ විධිවිධානවලට යටත් විය යුතු ය.

(3) භාණ්ඩ, ගුදම් භාණ්ඩ හෝ වෙළෙඳ භාණ්ඩ සංචලනයෙහි නොයෙදෙන, (1) වන උපවගන්තියේ සඳහන් යම් ව්‍යවසායක් ඉහත සඳහන් නිදහස් වරායකින් හෝ බන්ධිත ප්‍රදේශයකින් පිටත තම ක්‍රියාකාරකම් සිදු කරනු ලැබිය හැකි ය.

2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන අදාළ වීම ඇතැම් ව්‍යවසායන්ට ව්‍යාප්ත කිරීම.

18ආ. (1) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ඇති කරගත් ගිවිසුමක අර්ථානුකූලව පහත දැක්වෙන යම් ව්‍යාපාරයක් හෝ ව්‍යාපාරවල නිරතවන, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ දී හෝ එදිනට පසුව පිහිටුවන ලද යම් නව ව්‍යවසායක්, (2) වන සහ (3) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, අදාළ වන නිදහස් කිරීම් ප්‍රදානය කරනු ලබන 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ අදාළ වගන්තිවල දක්වා ඇති නියමයන් සපුරා ඇත්නම්, එම අදාළ වගන්තියෙන් ප්‍රදානය කරනු ලබන නිදහස් කිරීම සඳහා සුදුසුකම් ලබන්නේ යः-

(අ) ආනයනය, සුළු පිරිසැකසුම් සහ ප්‍රතිඅපනයනය සම්බන්ධ අන්තරාල වෙළෙඳාම;

(ආ) එක් රටකින් සපයනු ලැබිය හැකි හෝ එක් රටක දී නිෂ්පාදනය කරන ලද හෝ භාණ්ඩ ශ්‍රී ලංකාවට ගෙන එනු ලැබීමෙන් තොරව වෙනත් රටකට නැව්ගත කළ හැකි අක්වෙරළ ව්‍යාපාර;

(ඇ) විදේශීය සේවාදායකයන්ට පෙර නිමි සේවා සැපයීම ;

(ඈ) මූල්‍ය සැපයුම් දාමය කළමනාකරණය කිරීම සහ බිල්ගත කිරීම් මෙහෙයවීම මගින් ප්‍රධාන පෙළේ ගැනුම්කරුවන්ගේ මූලස්ථාන මෙහෙයුම් කටයුතු සිදු කිරීම ;

(ඉ) ශ්‍රී ලංකාව තුළ බන්ධිත ගුදම් හෝ විවිධ රටවල් සංගෘහිත කිරීම වැනි සැපයුම් සේවා සිදු කිරීම.

(2) ප්‍රතිඅපනයනය කිරීම සඳහා භාණ්ඩ, ගුදම් භාණ්ඩ හෝ වෙළෙඳ භාණ්ඩ ආනයනය කිරීමෙහි නිරතව සිටින (1) වන උපවගන්තියේ සඳහන් යම් නව ව්‍යවසායක් -

(අ) මේ පනතේ නියෝග මගින් ප්‍රකාශයට පත් කරන ලද නිදහස් වරායක දී හෝ බන්ධිත ප්‍රදේශයක දී එම කටයුතුවල නිරත විය හැකි ය;

(ආ) එවැනි නිදහස් වරායක සිට හෝ එවැන්නක් දක්වා හෝ බන්ධිත ප්‍රදේශයක සිට හෝ එවැන්නක් දක්වා ශ්‍රී ලංකා භූමියෙන් හෝ ශ්‍රී ලංකා භූමියට භාණ්ඩ සංචලනය කිරීමේ දී, (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, එම භාණ්ඩ, අවස්ථාචෝචිත පරිදි, ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද හෝ ශ්‍රී ලංකාවෙන් අපනයනය කරන ලද භාණ්ඩ ලෙස සලකා රේගු ආඥාපනතේ විධිවිධානවලට යටත් විය යුතු ය.

(3) භාණ්ඩ, ගුදම් භාණ්ඩ හෝ වෙළෙඳ භාණ්ඩ සංචලනයෙහි නොයෙදෙන, (1) වන උපවගන්තියේ සඳහන් යම් නව ව්‍යවසායක් ඉහත සඳහන් නිදහස් වරායකින් හෝ බන්ධිත ප්‍රදේශයකින් පිටත තම ක්‍රියාකාරකම් සිදු කරනු ලැබිය හැකි ය.

2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ විධිවිධාන අදාළ වීම ඇතැම් ව්‍යවසායන්ට ව්‍යාප්ත කිරීම.

18ඇ. (1) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ඇති කරගත් ගිවිසුමක අර්ථානුකූලව පහත දැක්වෙන යම් ව්‍යාපාරයක් හෝ ව්‍යාපාරවල නිරතවන, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ දී හෝ එදිනට පසුව පිහිටුවනු ලැබුවා වු ද, 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3 වන වගන්තිය ප්‍රකාර ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් වශයෙන් හඳුනාගනු ලැබුවා වූ ද, යම් නව ව්‍යාවසායක්, (2) වන සහ (3) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ ප්‍රදානය කරනු ලබන නිදහස් කිරීම්වලට සුදුසුකම් ලබන්නේ ය :-

(අ) ආනයනය, සුළු පිරිසැකසුම් සහ ප්‍රතිඅපනයනය සම්බන්ධ අන්තරාල වෙළෙඳාම;

(ආ) එක් රටකින් සපයනු ලැබිය හැකි හෝ එක් රටක දී නිෂ්පාදනය කරන ලද හෝ භාණ්ඩ ශ්‍රී ලංකාවට ගෙන එනු ලැබීමෙන් තොරව වෙනත් රටකට නැව්ගත කළ හැකි අක්වෙරළ ව්‍යාපාර;

(ඇ) විදේශීය සේවාදායකයන්ට පෙර නිමි සේවා සැපයීම;

(ඈ) මූල්‍ය සැපයුම් දාමය කළමනාකරණය කිරීම සහ බිල්ගත කිරීම් මෙහෙයවීම මගින් ප්‍රධාන පෙළේ ගැනුම්කරුවන්ගේ මූලස්ථාන මෙහෙයුම් කටයුතු සිදු කිරීම ;

(ඉ) ශ්‍රී ලංකාව තුළ බන්ධිත ගුදම් හෝ විවිධ රටවල් සංගෘහිත කිරීම වැනි සැපයුම් සේවා සිදු කිරීම.

(2) ප්‍රතිඅපනයනය කිරීම සඳහා භාණ්ඩ, ගුදම් භාණ්ඩ හෝ වෙළෙඳ භාණ්ඩ ආනයනය කිරීමෙහි නිරතව සිටින (1) වන උපවගන්තියේ සඳහන් යම් නව ව්‍යවසායක් -

(අ) මේ පනතේ නියෝග මගින් ප්‍රකාශයට පත් කරන ලද නිදහස් වරායක දී හෝ බන්ධිත ප්‍රදේශයක දී එම කටයුතුවල නිරත විය හැකි ය;

(ආ) එවැනි නිදහස් වරායක සිට හෝ එවැන්නක් දක්වා හෝ බන්ධිත ප්‍රදේශයක සිට හෝ එවැන්නක් දක්වා ශ්‍රී ලංකා භූමියෙන් හෝ ශ්‍රී ලංකා භූමියට භාණ්ඩ සංචලනය කිරීමේ දී, (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, එම භාණ්ඩ, අවස්ථාවෝචිත පරිදි, ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද හෝ ශ්‍රී ලංකාවෙන් අපනයනය කරන ලද භාණ්ඩ ලෙස සලකා රේගු ආඥාපනතේ විධිවිධානවලට යටත් විය යුතු ය.

(3) භාණ්ඩ, ගුදම් භාණ්ඩ හෝ වෙළෙඳ භාණ්ඩ සංචලනයෙහි නොයෙදෙන, (1) වන උපවගන්තියේ සඳහන් යම් නව ව්‍යවසායක් ඉහත සඳහන් නිදහස් වරායකින් හෝ බන්ධිත ප්‍රදේශයකින් පිටත තම ක්‍රියාකාරකම් සිදු කරනු ලැබිය හැකි ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය සංශෝධනය කිරීම.

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තියේ "16 වන, 17 වන සහ 18 වන වගන්ති" යන වචන හා ඉලක්කම් වෙනුවට "16, 17, 18, 18අ, 18ආ සහ 18ඇ වගන්ති" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

19අ සහ 19ආ යන වගන්ති ප්‍රධාන ප්‍රඥප්තියට ඇතුළත් කිරීම.

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තියට ඉත්බිතිව ම, පහත දැක්වෙන වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්ති 19අ සහ 19ආ ලෙස බලපැවැත්විය යුතු යඃ-

නියෝග.

19අ. (1) මේ පනතින් නියෝග සෑදිය යුතු යයි නියමිත හෝ නියෝග සෑදීමට බලය දී ඇති සියලු කාරණා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ ව්‍යාප්තියට අගතියක් නොමැතිව, අමාත්‍යවරයා විසින්, නියෝග මගින්-

(අ) මේ පනතේ මේ කොටසේ කාර්ය සඳහා නිදහස් වරාය සහ බන්ධිත ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීම ;

(ආ) මේ පනතේ මේ කොටස යටතේ සඳහන් ව්‍යවසායන් සඳහා ආයෝජන සීමා සහ අනෙකුත් නිර්ණායක නිශ්චිතව දැක්වීම;

(ඇ) දේශීය වෙළඳාම් සම්බන්ධයෙන් කොන්දේසි සහ නිදහස් කිරීම් නිශ්චිතව දැක්වීම ;

(ඈ) මේ පනතේ මේ කොටස යටතේ නිදහස් කිරීම් ප්‍රදානය කිරීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය නිශ්චිතව දැක්වීම; සහ

(ඉ) මෙහෙයුම් බලධරයන් සහ මෙහෙයුම් යාන්ත්‍රනය නිශ්චිතව දැක්වීම.

(3) (1) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු අතර, එසේ පළකරනු ලැබූ දිනයේ දී හෝ නියෝගයේ නිශ්චිතව සඳහන් පසු දිනයක දී ක්‍රියාත්මක විය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළකිරීමෙන් පසු හැකි පහසු ඉක්මනින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලබන සෑම නියෝගයක් ම එම අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු නමුත් එය යටතේ කලින් කරන ලද කිසිවකට හානියක් නොවිය යුතු ය.

(5) යම් නියෝගයක් පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු ය.

අර්ථ නිරූපණය. 19ආ. මේ පනතේ මේ කොටසේ පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස-

"ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය" යන්නෙන් ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය අදහස් වේ ;

"බන්ධිත ප්‍රදේශය" යන්නෙන් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් හෝ රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් හෝ වෙනත් යම් බලධරයකු විසින් අධීක්ෂණය කරනු ලබන සහ මේ පනත යටතේ නියෝග මගින් ප්‍රකාශයට පත්කරන ලද ප්‍රදේශයක් අදහස් වේ;

"විනිමය පාලකවරයා" යන්නෙන් (423 වන අධිකාරය වූ) විනිමය පලන පනත යටතේ පිහිටුවන ලද විනිමය පාලන දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා අදහස් වේ ;

"ආනයන හා අපනයන පාලකවරයා" යන්නෙන් (236 වන අධිකාරය වූ) ආනයන හා අපනයන (පාලන) පනතේ 2 වන වගන්තිය යටතේ පත්කරන ලද ආනයන හා අපනයන පාලකවරයා අදහස් වේ ;

"රේගු ආඥාපනත" යන්නේ (235 වන අධිකාරය වූ) රේගු ආඥාපනත අදහස් වේ ;

"රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා" යන්නෙන් රේගු ආඥාපනතේ 2 වන වගන්තිය යටතේ පත්කරන ලද රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා අදහස් වේ;

"අන්තරාල වෙළඳාම" යන්නට මේ පනතේ මේ කොටස යටතේ අනුමත කරන ලද සහ නව ව්‍යවසායක් විසින් මෙම කොටසේ නියෝග යටතේ ප්‍රකාශ කරන ලද නිදහස් වරායක් තුළ දී සියයට දහයක අවම දේශීය එකතු කළ අගයක් සහිතව ප්‍රති අපනයනය කිරීම සඳහා පවත්වාගෙන යන යම් නිෂ්පාදන ක්‍රියාවලියක් ඇතුළත් වේ;

"නිදහස් වරාය" යන්නෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අධීක්ෂණය යටතේ මෙහෙයවනු ලබන සහ මේ පනත යටතේ නියෝග මගින් ප්‍රකාශයට පත්කරනු ලැබූ මුහුදු වරායක් හෝ ගොඩබිම් වරායක් අදහස් වේ;

"සැපයුම් සේවා" යන්නෙන් වෙනත් කරුණු අතර-

(i) ප්‍රති නැව්ගත කිරීමේ කටයුතු ;

(ii) දේශීය අපනයනකරුවන් සඳහා යෙදවුම් සහ සම්පූර්ණ කරන ලද භාණ්ඩ තාවකාලිකව ගබඩා කිරීම සඳහා ගුදම්ගත කිරීම; සහ

(iii) විදේශීය සේවාදායකයන්ට නැව් බඩු ගෙන යාමේ පහසුකම් සැලසීම,

ඇතුළත් වේ;

"ශ්‍රී ලංකා වරාය අධිකාරිය" යන්නෙන් 1979 අංක 51 දරන ශ්‍රී ලංකා වරාය අධිකාරිය පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා වරාය අධිකාරිය අදහස් වේ;

"ශ්‍රී ලංකා භූමිය" යන්නෙන් ශ්‍රී ලංකා ජනරජයේ භූමිය අදහස් වන අතර මේ පනතේ මේ කොටස යටතේ ප්‍රකාශිත යම් නිදහස් වරායක් හෝ බන්ධිත ප්‍රදේශයක් ඊට ඇතුළත් නොවේ.".

ප්‍රධාන ප්‍රඥප්තියට උපලේඛනය එකතු කිරීම .

13. ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපලේඛනය මෙයින් එකතු කරනු ලැබේ:-

"උපලේඛනය (18අ වගන්තිය)

1. 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත ;

2. 2009 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත ;

3. 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත ;

4. 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත ;

5. 2011 අංක 18 දරන වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු පනත ;

6. 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත".

## IV වන කොටස

### බෝග රක්ෂණ බද්ද පැනවීම

**14.** (1) ස්වාභාවික ආපදා හේතුවෙන් ශ්‍රී ලංකාවේ ගොවීන් මුහුණ දෙන හානි ආවරණය කිරීමේ අරමුණ ඇතිව, මෙහි උපලේඛනයේ නිශ්චිතව සඳහන් කර ඇති පනත් යටතට ගැනෙන සෑම ආයතනයකින් ම එවැනි ආයතනවල බදු අය කිරීමෙන් පසු ලාභයෙන් සියයට එකක ප්‍රතිශතයක් වූ (මින්මතු මේ කොටසේ " බද්ද' යනුවෙන් සඳහන් කරනු ලබන) බෝග රක්ෂණ බද්දක් අය කරනු ලැබිය යුතු ය. බෝග රක්ෂණ බද්ද පැනවීම.

(2) මේ කොටස යටතේ පනවනු ලැබූ බද්ද, 2006 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල පනත මගින් පිහිටුවන ලද ජාතික රක්ෂණ භාර අරමුදල් මණ්ඩලය විසින් පවත්වාගෙන යනු ලබන සහ පරිපාලනය කරනු ලබන වෙන් කළ ගිණුමක් වෙත ප්‍රේෂණය කරනු ලැබිය යුතු ය.

(3) මේ පනතේ මේ කොටසේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ දී අවශ්‍ය වන්නා වූ විධිවිධාන මේ පනත යටතේ සාදනු ලබන නියෝග මගින් නියම කරනු ලැබිය යුතු ය.

**15.** (1) මේ පනතින් නියෝග සෑදිය යුතු යයි නියමිත හෝ නියෝග සෑදීමට බලය දී ඇති සියලු කාරණා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය. නියෝග.

(2) (1) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු අතර, එසේ පළකරනු ලැබූ දිනයේ දී හෝ නියෝගයේ නිශ්චිතව සඳහන් පසු දිනයක දී ක්‍රියාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළකිරීමෙන් පසු හැකි පහසු ඉක්මනින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලබන නියෝගයක් එම අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු නමුත් එය යටතේ කලින් කරන ලද කිසිවකට හානියක් නොවිය යුතු ය.

(4) යම් නියෝගයක් පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

**16.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

උපලේඛනය

(14 වන වගන්තිය)

1. 1988 අංක 30 දරන බැංකු පනත;
2. 1988 අංක 78 දරන මුදල් සමාගම් පනත ;
3. 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.